ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.ප./ලි/001

ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, යොමු අංකය 1817-002
2017 ඔක්තෝබර් 14

දයාබර දෙමාපියන් වෙත,

<u>වාහන නැවැත්වීම, දරුවන් දහම් පාසලට කැඳවාගෙන ඒම සහ කැඳවාගෙන යාම - කොන්දේසි කඩකිරීම</u>

පසුගිය දෙසැම්බර් මස අවාසනාවන්ත ලෙස දහම් පාසල වසා දැමීමට සිදුවූ කාරණා, ඒ පිළිබඳව දහම් පාසලේ සංවිධායක මණ්ඩලය ගත් ක්‍රියා මාර්ග සහ දහම් පාසල නැවත ආරම්භ කිරීම සඳහා අප ලබාගත් විශේෂ අවසරය පිලිබඳව, අප එකඟ වූ ගිවිසුම අනුව දෙමාපියන් විසින් පිළිපැදිය යුතු කොන්දේසි සම්බන්දව ඔබතුමා / ඔබතුමිය දැනුවත් කළ අතර, එම කොන්දේසි නොපිරිහෙලා පිළිපදින බවට සහතික කල කොන්දේසි පත්‍රිකාව අත්සන් කර අපට භාරදුන් බව ඔබ ඉතා හොඳින් දන්නා කරුණකි.

සියලුම නවක දරුවන්ගේ දෙමාපියන් ද එම කොන්දේසි මාලාව එලෙසම අත්සන් කර අපට ලබා දී ඇති බවද මතක් කරන්නෙමු. එම කොන්දේසි නොපිරිහෙලා පිළිපදින දෙමාපියන්ට අපගේ ස්තුතිය පුදකරමු.

එවැනි කොන්දේසි කඩකිරීමකදී ඔබ කටයුතු කලයුතු ආකාරය ඔබ අත්සන් කල කොන්දේසි මාලාවේ සඳහන්ව ඇති බැවින් අප ඔබට නැවත මතක් කිරීමට අවශ්‍ය නැති බව අපගේ විශ්වාසයයි.

එනමුත්, නව වසරේ දහම් පාසල ආරම්භයේ සිට මේ දක්වා නොකඩවාම අප දරුවන්ගේ දෙමාපියන් කිහිපදෙනෙක් මෙම කොන්දේසි කඩකරමින් ඔවුන්ගේ දරුවන් දහම් පාසලට ගෙන ඒම / රැගෙන යාම සිදුකරමින් <u>දහම් පාසලේ පැවැත්මට තර්ජනය වන අයුරින් කටයුතු කොට ඇති බව</u> අපට වාර්තා වී ඇත.

වාර්තා වී ඇති සමහර කොන්දේසි කඩකිරීම් ඔබගේ දැනගැනීම සඳහා පහත සඳහන් කරමු:

1. තහනම් මාර්ග වල වාහන නැවැත්වීම සහ / හෝ වාහන රඳවාගෙන දරුවන් වාහන වලට නැගීම හෝ බැසීම.
2. ද්විත්ව නවතනය (double parking), සහ කොන්සල් ජනරාල් කාර්යාලය පිටුපස මාර්ගයේ නිවැසියන්ගේ ගේට්ටු ඉදිරියේ වාහන නවත්වා අවහිර කිරීම.
3. දහම් පාසල පිටුපස ඇති පල්ලියේ වාහන නැවතුමේ (car park) වාහන ගාල් කිරීම සහ ඒ අසල කණ්ඩායම් වශයෙන් රැඳී සිටීම.

ඔබගේ දරුවන් වෙනත් කෙනෙකු සමග හෝ කුලී රථයකින් හෝ දහම් පාසලට එවන අවස්ථාවන්හිදී එම රියදුරන් හට අවශ්‍ය උපදෙස් දීම ඔබගේ වගකීම වන බවද, එම රියදුරන් පනවා ඇති නීති කඩකිරීමේදී එම වරදට වගකීම ඔබ විසින් බාරගත යුතු බවද අවධාරණය කරමු.

දහම් පාසලට තම දරුවන් කැඳවාගෙන එන අවස්ථාවන්හිදී නීති විරෝධී ලෙස හැසිරෙමින් තම දරුවන් හට ලබාදෙන මෙම වැරදි ආදර්ශය සහ ඔබ විසින් දහම් පාසලට සහ දහම් පාසලේ ඉගෙන ගන්නා සියලුම දූ දරුවන්ට අධ්‍යාපනය ලැබීමට ඇති අවස්ථාව නැති කිරීමට අනුබල දෙන අයුරෙන් කටයුතු කිරීම අපට කෙසේවත් අනුමත කල නොහැක.

ඔබ විසින් එකඟ වී ඇති කොන්දේසි කඩකිරීමේදී දරුවාගේ දහම් පාසලේ ශිෂ්‍ය භාවය අහෝසි වන බව කරුණාවෙන් මතක් කරමු. එවැනි අවස්ථාවකදී, ඒ පිළිබඳව කිසිම සාකච්චාවකට දහම් පාසල සංවිධායක කමිටුව ඉදිරිපත් නොවන බවද අවධාරණය කරමු.

ස්තුතියි,

සංවිධායක මණ්ඩලය

Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.
TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org